# ලංකාවිත්ති
# LANKA VITHTHI


මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය! Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 11
NUMBER 12

✻ ✻ ✻ ✻ ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත ✻ ✻ ✻ ✻
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MARCH 10, 2009 මාර්තු මාසය (බුද්ධ වර්ෂ 2552 මැදින් මාසය)

නැත කිසි බැඳුම් හැරයන්නට බැරි විලස
නැත දුක් හඬන්නට අද හෝ හෙට දවස
නැත බර පොදි, පෙලෙන සාගිනි හෝ පවස
ඇත සිත සතුට වන මුළු ලොව මගෙ නිවස

No bonds what so ever that are difficult to renounce
No sorrows to make me cry now or the next day
No heavy weight to bear, or pangs of hunger or thirst
Inner **bliss** makes the world my home, wherever I stay

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# යුද්ධය යනු යුද්ධය මැයි!

♦ සංජය විමලරත්න

### *ජාති / දේශ හිතෛෂී සටනක ජයග්‍රාහී අවසන අත ළඟය*

**අ**ප රටේ ජනතාව අන්ත දුකට හෙළමින් වසර විසිපහකට වඩා ඇදෙමින් ගිය කුරිරු යුද්ධයක ජයග්‍රාහී අවසානය දැන් අත ළඟය. අප වීරෝදාර සේනාවන් විසින් පුදුකුඩිරිප්පු ප්‍රදේශයේ අල්ලක පමණ භූමි භාගයකට කොටුකරනු ලදුව උන්ගේ කොටි නායකයින් ගෙන්ද සමන්විත කොටිරැළ අව සානයටම විනාසකර දමන අවසන් තීරණාත්මක සටනෙහි අප සන්නද්ධ හමුදාවෝ යෙදී සිටිති. මුලතිව් වලට ඔවුන් බලෙන් කොටු කරගත් අහිංසක ජනතාව අද සිය පළිහ ලෙස භාවිතාකරමින් කොටි මෙම සටන කරන බව ඉන් බේරී පලා එන අයගෙන් ආරංචි වෙයි. හැකි හැම දෙනෙක්ම සටනේ පෙරට බලෙන් තල්ලුකර යවමින් සිය පණ බේරාගැනීම මෙම නිහීන කොටින් ගේ අවසාන ප්‍රයත්නය ද වෙයි.

සටන් උග්‍රවීමට පෙර හැකි සමහර අය පැන ආහ. ඉතිරි අය දැන් තුවක්කු බලෙන් රඳවාගනු ලැබ ඇත. මෙහි අරමුණු උන්ගේ පව ප්‍රචාර මගිනුත්, බටහිර විසිරී සිටින කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාව මගිනුත් රජය මෙහෙයවන යුද්ධය කට කොටුවී සිටින දෙමළ අසරණ යින් රැසක් ලෙස පෙන්වාලමින් ජාත්‍යන්තර අවධානය එයට යොමුකර- වාලමින් එය මානව ආරක්ෂා ප්‍රශනයකට හරවා රජය කොටි විනාශකිරීමට ගෙන යන සටන බාලකොට මොටකරලීමේ අවසන් තුරුම්පුව ලෙස යොදාගැනීමේ උපක්‍රමයකි. මේ සියල්ල උපයෝගී කර ගනිමින් නායක රැළ රටින් පැනයාමට කරන මේ ප්‍රයත්නය නිවැරදිව හඳුනාගත් රජය සහ අප හමුදාවන් පසුගිය සතිකීපය තුළ මුන්ව හරස්කරමින් කොටුකරලීම ඉතා ශූර උපක්‍රමයක් විය.

### *අභ්‍යන්තර සහ බාහිර නොයෙක් බලවේග අපේ සතුරන් සහ මිතුරන්*

පසුගිය සති කීපය තුළ රට අභ්‍යන්තරයේ හමුදාව කොටින්ට එරෙහිව ගෙනගිය සටන වේගවත්වූ අතර උන්ගේ පැවති බල කොටු එකින් එක සීඝ්‍රයෙන් බිඳවැටිණ. ප්‍රභාකරන් ඇතුළු නායකයෝ සුඛෝපෝ භෝගීව නිවැසි බංකර් පවා ලහිලහියේ අතහැර පලාගියහ. ඉතිරිව තිබුණු ප්‍රධාන නගරයක් වූ මුලතිව්ද රජයේ හමුදාවනට අත්පත්වූ පසු අද පවතින තත්වයට උන් කොටුවී සිටිති.

මෙසේ කොටි හමුදා අභ්‍යන්තරයේ පසුබසින විට බාහිර සතුරු බලවේග එන් එන්නම වැඩි වැඩියෙන් රජය ගෙන යන මේ වීරෝදාර ක්‍රියාවළියට එරෙහිව අවි අමෝරාගෙන එන්නට විය. මින් ප්‍රධානම සතුරා වූයේ ලෝකයේ හැම තැනම විසිරී සිටින දෙමළ ජනකොට්ඨාශයේ (ඩයස්පෝ රාවේ) කොටි නියෝජිත ක්‍රියාකාරීන්ය. කොටි ව්‍යාපාරයට මුදල් රැස්කිරීම සඳහා ද්‍රවිඩ ජනයාට හා ද්‍රවිඩ ව්‍යාපාරිකයන්ට බලපෑම්කරමින් කප්පන් එකතු කළ, මත්ද්‍රව්‍ය ජාවාරම් ක්‍රෙඩිට් කාඩ් වංචා ආදී සෑම නිහීන ආකාරයකින්ම මුදල් ගරන මුන්ද මුන් විසින් සම්බන් ධතා ගොඩ නගාගෙන ඇති මුන් ඡන්ද බ්‍රෝකර්ලා වශයෙන් කටයුතු කරන බ්‍රිතාන්‍යයේ කැනඩාවේ ආදියේ සිටින බංකොලොත් දූෂිත දේශපාලක යන්ද මුන්ගේ සල්ලිවලට යටවී ලියන පුවත්පත් ලේඛකයින් සහ බීබීසී ප්‍රමුඛ මාධ්‍ය ජාලයන්ද ආදී සියල්ලෝ එකම තූර්යවාදක කණ්ඩායමක් ලෙස වයන්නට පටන්ගත්තෝ ය. මේ සියල්ල මෙය කියවන ඔබ ද දනිති.

### *ඉන්දියානු බලපෑම් ප්‍රයත්නය*

පළමුව දැන් මාස කීපයකට පෙර ලංකාවට විරුද්ධව අවි අමෝරාගෙන ආවේ ඉන්දියාවයි. තමිල් නාඩුවේ බලපෑම් යටතේ අපේ ප්‍රශ්නයට අත පොවන්නට ඉන්දියාව උත්සාහ කළ අන්දම සහ අප රජය විසින් මෙය අප රටේ ත්‍රස්තවාදී කණ්ඩායමක් මෙල්ල කිරීමට කරන කටයුත්තක් සහ අප සෛවරී රාජ්‍යයේ අභ්‍යන්තර ප්‍රශ්න යක් බවද පෙන්වාදෙනු ලැබීමෙන් පසුව ඉන්දියාව පල්ලම් බැස්ස හැටි කවුරුත් දනිති. කෙසේ වුවද මෙම කාරණය ඉදිරියට මුහුණදෙන්නට වන තත්වයකට ලංකා රජය සූදානම් කරවූ හොඳ පෙරහුරුවක් විය.

### *බ්‍රිතාන්‍යය අතපෙවීමට කළ උත්සාහය*

දිනෙන් දින උග්‍රවන කොටින්ගේ පරාජය ඉවසිය නොහැකි තැන මෙහි සිටින කොටි ඡන්ද බ්‍රෝකර්ලාගේ සහ ලේබර් හා ලිබරල් කොටි හිතවාදී මන්ත්‍රීවරුන්ගේ බලපෑම නිසා අගමැති ගෝඩ්න් බ්‍රවුන් මේ ගැන සොයා බලා කටයුතු කිරීමටය කියා නිත්‍ය නියෝජිතයෙකු ලංකාවට යැවීමට තීරණය කළේය. මෙය ජාත්‍යන්තර කටයුතුවලදී පිළිපදින සම්ප්‍රදායට පවා පටහැනිය. එය ශ්‍රී ලංකාව පෙර මුන්ගේ යටත් විජිත යක්ව පැවති තත්වයට ඇද දමා කළ කටයුත්තක් විය. අප නිදහස් සෛවරී රාජ්‍යයක් බව ඔහුට අමතක වූ සෙයකි. නියෝජිතයා එවීමේ එම ක්‍රියාව තරයේම ප්‍රතික්ෂෙප කළ අප ජනාධිපතිතුමා සෛවරී රාජ්‍යයකට ඇඟිලි ගැසීමට ඔවුනට බලයක් නැති බව පෙන්වා දුන් පසු හෙමින් පල්ලම් බැසීමට බ්‍රවුන්ට සිදුවිය.

1972 දී ශ්‍රීලංකා රජය නව ව්‍යවස්ථාවක් මගින් නිදහස් සෛවරී ජනරජයක් බිහිකරලමින් එයට පෙර තිබූ ඩොමීනියන් තත්වය වෙනස්කර ලීමේ වටිනාකම කොපමණදැයි මෙහි දී මෙනෙහි කිරීම වටී.


4 වන පිටුව බලන්න ⟶




**See the difference NOW! මෙන්න! වෙනස**


ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/





ලොවපුරා මුදල් යැවීම සඳහා එකම විශ්වාසවන්ත නාමය

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3